# CENTRE FOR MONITORING ELECTION VIOLENCE
# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය
# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

**No:** 24/2, 28th Lane, Off Flower Road, Colombo 07
**Tel:** +94 11 2565304 – 6, 5552746, 5552749, **Fax:** +94 114714460
**E-mail:** cmev@cpalanka.org **Website:** www.cpalanka.org

**උතුරු පළාත් සභා ඡන්ද විමසීම 2013**

**මාධ්‍ය නිවේදනය - අංක 06**

2013 සැප්තැම්බර් 20 වන දා, චුල්ලිපුරම්,වඩුක්කොඩයි මැතිවරණ කොට්ඨාශය,

**යාපනය දිස්ත්‍රික්කය-**

උතුරු පළාත

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරික්ෂන මධ්‍යස්ථානයේ (මැ.ප්‍ර.නි.ම) - CMEV) ක්ෂේත්‍ර නිරීක්ෂකයකු විසින් වාර්තාකර ඇති පරිදි චුප්ලිපුරම් ප්‍රදේශයේ තෝල්පුරම් හී පිහිටි ආනන්දි සසීධරන් (යාපනය දිස්ත්‍රික්කයේ ද්‍රවිඩ ජාතික සන්ධානයේ (TNA) අපේක්ෂක අංක 01) මහත්මියගේ නිවස හා මැතිවරණ ව්‍යාපාර කාර්යාලය වෙත ආරක්ෂක හමුදා සාමාජිකයින් යැයි කියැවෙන කණ්ඩායමක් විසින් පහර දී ඇත. මෙය සිදුවී ඇත්තේ 19 වන දින මධ්‍යම රාත්‍රියේදී පමණය. එම කණ්ඩායමේ ඇතැම් සාමාජිකයින් සිංහලෙන් කථා කොට ඇති අතර ඔවුන් ඇඳ සිටි ඇඳුම් අනුව ඔවුන් හමුදා භටයින් ලෙස මැ.ප්‍ර.නි.ම ය විසින් හඳුනා ගනු ලැබ ඇත. පහර කෑ අයට සහයවීමට පැමිණි නීතීඥවරයෙකු වු සුගාෂ් මහතා ඇතුළු (09) දෙනෙකු මේ සිද්ධියේදි තුවාල ලබා ඇත. සසීධරන් මහත්මිය සහ ඇගේ දරුවන් මෙම ප්‍රහාරයෙන් බේරීමට සමත්ව ඇත.

මැ.ප්‍ර.නි.ම ය (CMEV) විසින් පෙ.ව 12.45 ට පමණ යාපනයේ පොලිස් මූලස්ථානය සම්බන්ධ කරගත් විට ඔවුන් කියා සිටියේ තමන් මෙම සිදුවීම පිළිබඳව නොදන්නා බවයි. එසේ ප්‍රකාශ කොට මැ.ප්‍ර.නි.ම ය වඩුක්කොඩයි පොලිසිය වෙත යොමුකරන ලදි. කෙසේ වුවද පෙ.ව. 1.05 ට පමණ මැ.ප්‍ර.නි.ම ය විසින් වඩුක්කොඩයි පොලිසිය සම්බන්ධකර ගත්විට ඔවුන් ප්‍රකාශ කළේ චුල්ලිපුරම් ප්‍රදේශය තමන්ගේ කොට්ඨාශයට අයත් නොවන බව තමන්ට දැනුම් දෙනු ලැබ ඇති බවය. කෙසේ නමුත් නැවත ඔවුන් සම්බන්ධකර ගත්විට පොලිසිය විසින් දැනුම් දුන්නේ පොලිස් කණ්ඩායමක් එම ස්ථානයට යොදවා ඇති

බවය. පෙරවරු 8.00 ට පමණ පොලිසිය මැ.ප්‍ර.නි.ම ය වෙත දැනුම් දුන්නේ මෙම සිද්ධිය පිළිබඳව නිලවශයෙන් පැමිණිල්ලක් තමන් වෙත කර නොමැති බවය.

ප්‍රහාරය සිදු කළවුන් ලෙස වන ආරක්ෂක හමුදාවන් හි සමබන්ධතාවය පිළිබඳව මැ.ප්‍ර.නි.මය (CMEV) විශේෂයෙන් තම සැලකිල්ල යොමු කරයි. ඡන්දදායකයන් හට තර්ජනය කිරීම සහ බියවැද්දීම සහ යම් විශේෂිත අපේක්ෂකයන් වෙනුවෙන් නිල ඇඳුමෙන් සැරසුණු හමුදා සාමාජිකයින් යුධ හමුදා බුද්ධි අංශ සාමාජිකයින් හා සිවිල් ආරක්ෂක බලකායේ සාමාජිකයින් මැතිවරණ ව්‍යාපාරයේ හි යෙදීම පිළිබඳව වූ සිද්ධීන් සම්බන්ධයෙන් වන චෝදනාවන් ගණනාවක් මැතිවරණ ව්‍යාපාර කාලය පුරාම වාර්තා විය. සැප් 18 වන දා බදාදා මධ්‍යම රාත්‍රීයේදී මැතිවරණ ව්‍යාපාරය අවසන් වූ තැන් පටන් මැ.ප්‍ර.නි.මයට වාර්තා වූ මෙබඳු සිදුවීම් සංඛ්‍යාව වැඩි වී ඇත.

ක්‍රියාත්මක ප්‍රජාතන්ත්‍රවාදයක තේරීම හා වෙනස් කිරීම පිළිබඳව වූ මූලික යාන්ත්‍රණය වන මැතිවරණ ව්‍යාපාරයට මොනම ආකාරයකින් හෝ ආරක්‍ෂක හමුදාවන් සම්බන්ධවීම මැතිවරණ ප්‍රචන්ඩක්‍රියා නිරීක්‍ෂණ මධ්‍යස්ථානය (CMEV) විසින් කොන්දේසි විරහිතව හෙළා දකී. එබඳු මැදිහත්වීම් මැතිවරණ ව්‍යාපාරයේ සුපිළිපන් බවට දැඩි ලෙස හානිකර වේ. විශේෂයෙන්ම මෙම මැතිවරණයේ සන්දර්භය තුළ එමගින් රටේ සමඟි සන්ධානය සහ එකමුතුකමටද බරපතල හානි පැමිණේ.

මැතිවරණ කොමසාරිස්වරයා සහ අදාළ සියළු අධිකාරීන් ගෙන් මැතිවරණ ප්‍රචන්ඩක්‍රියා නිරීක්‍ෂණ මධ්‍යස්ථානය (CMEV) ඉල්ලා සිටින්නේ එබඳු මැදිහත්වීම් සිදුවීම නවතින බවට සහතික කිරීමට ක්‍රියාකරන ලෙස සහ එබඳු ප්‍රචණ්ඩ ක්‍රියාවන් සහ අක්‍රමිකතාවයන් පිළිබඳව පරීක්‍ෂණ පවත්වා වරදකරුවන් නීතිය හමුවට පැමිණවීමට කටයුතු කරන ලෙසය. රටේ මැතිවරණ ප්‍රජාතන්ත්‍රවාදයේ ආයතන සහ ක්‍රියාදාමයන් ආරක්ෂා කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා ඊට අඩු කිසිවක් සමත් නොවේ.

| | | |
|---|---|---|
| ආචාර්ය පී. සරවනමුත්තු | සුනිල් ජයසේකර | උදය කළුපතිරණ |
| සම කැඳවුම්කරු | සම කැඳවුම්කරු | සම කැඳවුම්කරු |